# මාරස්සන තලාව රජමහා විහාර ගෙයින් හෙළිවන තත්කාලීන සමාජ තතු

ආර්.එම්.එන්.එස්.කේ රණතුංග[1]

ඩබ්.ඩී.එස්.එල් වීරසිංහ[2]

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරස්සන ග්‍රාම නිළධාරී වසමට අයත් ව පිහිටියා වූ මාරස්සන තලාව රජමහා විහාරස්ථානයේ විහාර ගෙය මහනුවර යුගයේ කලාව මැනවින් නිරූපණය කරන්නාවූ නිර්මිතයක් ලෙස වැදගත් ය. මහනුවර යුගයේ අනන්‍යතාව රැගත් සඳකඩ පහන, පියගැටපෙළ සහිත ප්‍රවේශයක් මෙහි වෙයි. ඒ දෙ පස සිරස් ව ඉදිව ඇති දෙ බිත්ති විදේශිකයින් නිරූපිත සිතුවමක් ලෙස හඳුනාගත හැකි ය. ආයත චතුරශ්‍රාකාරගත් විහාර ගෙයෙහි පෙර කී ප්‍රවේශයෙන් අනතුරු ව අර්ධ චන්ද්‍රාකාර ද්වාරය දෙ පස දොරටුපාල ප්‍රතිමා ද්විත්වයක් සහිත අන්තරාල කොටසේ බිත්තිවල මෛත්‍රී බෝධිසත්ත්ව රුවක්, රදළවරයෙකුගේ රුවක්, දේව රූ, විදේශීය ලක්ෂණ සහිත වියපත් පුද්ගලයෙකුගේ රුවක් මෙන් ම සිවිලිමේ උඩුකය සත්ත්ව ස්වරූප ගත් යටි කය මනුෂ්‍ය ස්වරූප ගත් සුවිශේෂී මනඃකල්පිත සිතුවම් කිහිපයකින් අලංකාරවත් ව ඇත. අන්තරාලයෙන් ප්‍රතිමා ගෘහයට පිවිසෙන දොරටුව දැව කැටයම්, පිත්තල එබ්බවීම් සහ ඇත් දළ කැටයම් සහිත ව නිමවා ඇති අතර එම ද්වාරය පවා සිතුවම්කරණයට ලක්කර ද්වාරය වටා ඇත් දළ කැටයම් තීරු යෙදවීම සමකාලීන ශිල්ප කලාව මෙන් ම ආර්ථිකමය හැකියාව ද නිරූපණය කරන්නකි. ප්‍රතිමා ගෘහයේ බිත්තිවල දේව රූපවලට අමතර ව විශේෂයෙන් පනේල වෙන් කොට වම් පස තේමිය ජාතක කතා වස්තුවත් දකුණු පස වෙස්සන්තර ජාතක කථා වස්තුව ත් ශෛලිගත මෙන් ම ස්වාභාවිකත්වයට නැඹුරුව කළ සිතුවම්කරණයක් ලෙසින් නිරූපණය කර ඇත. රහතන් වහන්සේලා, අනාගතයේ බුදුවන්නන් මෙන් ම දිවයිනේ විවිධ ස්තූපයන් ඇඳ නාමකරණයට ලක්කර ඇත. මහනුවර යුගයට අයත් කලා ලක්ෂණ සහිත බුද්ධ ප්‍රතිමාව දෙ පස බුද්ධ ප්‍රතිමා ද්විත්වයක් සහ දේව ප්‍රතිමාත් ඉන් ඉහත මකර තොරණක් ද වෙයි. සිවිලිමේ විවිධ මල් ලියකම් ආශ්‍රිත අලංකරණ වන අතර මේ සියල්ල මහනුවර යුගයට අයත් ද්විමාන සිතුවම්කරණ ස්වරූපයත් තත්කාලීන යුගයට අයත් වර්ණ යොදා ගැනීමත් ගැබ් ව පවතියි. වර්ණාලේපිත තලාඳ, බාල්කවලින් දරා සිටිනුයේ මැටි කොත් ද්විත්වයකින් යුක්ත උපරිභාගයකි. උක්ත සිතුවම්, අලංකරණ, කැටයම් සහ ප්‍රතිමා ආදී කොටගත් නිර්මිතයන් ආශ්‍රිත ව කෙබඳු තත්කාලීන සමාජ යථාර්ථයක් හෙළිකරගත හැකි ද යන්න විධිමත් ව තවදුරටත් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය සිදුකිරීමේ අරමුණ වෙයි.

ප්‍රමුඛ පද: මාරස්සන තලාව රජමහා විහාරය, ද්විතියික අලංකරණ, තත්කාලීන සමාජ තතු

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ranathunga.nilmini@yahoo.com.

[2] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, Sanju.pera.879@gmail.com.